ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
பொருளாதார அபிவிருத்தி அமைச்சு
Ministry of Economic Development

# දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

24/4, කාසල් වීදිය, කොළඹ -8.
24/4, காசல் வீதி, கொழும்பு – 08.
24/4, Castle street , Colombo - 08.

මගේ අංකය / எனது இல / My No: DDD/HO/MF/05

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2014/11/12

**චක්‍රලේඛ අංක :- (i) /10/2014**

සියළුම දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරුවන් වෙත,

**<u>2014 අයවැය යෝජනා මඟින් හඳුන්වාදෙනු ලැබූ රජයේ නිලධාරින්ට යතුරුපැදි ලබාදීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ලබාදෙන යතුරු පැදි සඳහා, රු. 50,000/- ක ණය මුදල ප්‍රජා මූල බැංකු සමිති මඟින් ලබාදීම.</u>**

2014/10/07 දිනැති අංක 10/2014 චක්‍රලේඛණයට වැඩිමනත් වශයෙනි.

ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය හා වේගවත් කිරීමේ අරමුණෙන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට සහනදායී ක්‍රමයට යතුරුපැදි ලබාදීමට රජය විසින් තීරණය කර ඇත.

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ලබාදෙනු ලබන මෙම යතුරුපැදි සඳහා ප්‍රජාමූල බැංකු සමිති මඟින් ණය ලබාදීමට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ යෝජනාව අනුව දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය මඟින් රු. 50,000 ක උපරිමයකට යටත්ව ණය ලබාදීමට කටයුතු කළ යුතුය.

01. පොලී අනුපාතය හා ආපසු ගෙවීම් කාලය
    - i. උපරිම ණය මුදල - රු. 50000කි.
    - ii. ණය ආපසු ගෙවීම් උපරිම කාලය - මාස 18 කි.
    - iii. වාර්ෂික පොලී අනුපාතය - 6.5%
02. අරමුදල් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
    - i. 10/2014, චක්‍රලේඛනයෙහි 5.1 හා 5.2 කරුණුම අදාළ වේ.
    - ii. අරමුදල් ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී ප්‍රජා මූල බැංකු අංශය වෙතින් ප්‍රතිමූල්‍ය ණය ඉල්ලුම් කළ යුතුය.
03. ණය අයදුම්කරු සපුරාලිය යුතු කොන්දේසි
    - i. ණය මුදලේ වාරිකය ගරු ප්‍රාදේශීය මන්ත්‍රීවරුන්ට ලැබෙන දීමනාවක් මාසිකව අයකර එවිය යුතුය.
    - ii. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දෙපලක් ඇප වශයෙන් ඉදිරිපත් කළ යුතුය.


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/ தொலைபேசி/Telephone: | 011-2669703 | 011- 2669700 | 011-2685888 | 011-2669725 |
| ෆැක්ස්/ தொலைமடல்/Fax: | 011-2669709 | 011-2678203 | 011-2695579 | 011-2669725 |
| ඊ-මේල්/ மின்னஞ்சல்/E-Mail: | dgdivineguma@gmail.com | hrddivineguma@gmail.com | divinegumaaccbranch@gmail.com | |

04. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන ප්‍රාදේශීය සභා මන්ත්‍රී තනතුරු දරණ ගරු මන්ත්‍රීවරුන් පෙර මේ යටතේ ණය ලබාගෙන ඇත්නම් මේ ණය ක්‍රමය අදාළ කර ගත යුතු නොවේ.

අංක 10/2014 දරණ චක්‍රලේඛණයේ අනෙකුත් කරුණු නොවෙනස්ව පවතින බව කාරුණිකව දන්වමි.

**ආර්.ඒ.ඒ.කේ. රණවක,**
**අධ්‍යක්ෂ ජනරාල්.**

**පිටපත් :-**

1. ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා - කා.දැ.ස.
2. සියලුම ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා - කා.දැ.ස.
3. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ස.
4. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය - කා.දැ.ස.
5. කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (කලාප අංක 01,02,03,04,05,06) - අ.ක.ස.
6. දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කා.දැ.ස.
7. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්. - කා.දැ.ස.
8. ප්‍රධාන ගණකාධිකාරි, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
9. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
10. විගණකාධිපති - කා.දැ.ස.
11. සියලුම අධ්‍යක්ෂවරුන් , දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
12. දිස්ත්‍රික් දිවිනැගුම නිලධාරී (පාලන හා සමාජ ආරක්ෂණ) - අ.ක.ස.
13. දිස්ත්‍රික් දිවිනැගුම නිලධාරී ( ප්‍රජා මූල සංවිධාන හා ජීවනෝපාය සංවර්ධන) - අ.ක.ස.
14. දිස්ත්‍රික් දිවිනැගුම නිලධාරී ( ක්ෂුද්‍ර මූල්‍ය) - අ.ක.ස.
15. සියලුම කලාප, දිස්ත්‍රික්, ප්‍රාදේශිය, බැංකු කළමනාකරුවන් සහ වසම්භාර දිවිනැගුම නිලධාරින්. - අ.ක.ස.